ආඛ්‍යාන Narrations
Volume 03 | Issue 01&02 | 2018 | Article 04
ISBN 2478-0642

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාව [63]

සරත් ආනන්ද [64]

saratananda@gmail.com

BA Hons, M.Phil, PhD

**සාරසංක්ෂේපය**

අප්‍රිකානු - ශ්‍රී ලාංකිකයන් හෙවත් පොදුවේ ශ්‍රී ලාංකික කාපිරි ප්‍රජාව වශයෙන් ප්‍රචලිත ජන කොටසක් දිගු කාලයක් තිස්සේ මෙරට වාසභූමි කරගෙන දිවි ගෙවන බව දන්නෝ සීමිත පිරිසකි. ශ්‍රී ලංකාවේ පෘතුග්‍රීසි පාලන සමයේ පටන් වරින් වර විවිධ කාලච්ඡේදයන්හිදී වහලුන්, ගෘහස්ත සේවකයන්, ගොඩනැඟීම් ක්‍රියාකාරකම් සඳහා කම්කරුවන්, නාවික අත් උදව් කරුවන් මෙන්ම බහුල වශයෙන් කුලී හේවායන් ලෙස මෙරටට ගෙන්වන ලද කාපිරි ප්‍රජාව පසු කාලීනව ශ්‍රී ලංකාව පුරා විසිරී සිටි බවට සාක්ෂි හමුවෙයි. මෙම ශාස්ත්‍රීය වියමන එදා මෙදා තුර විවිධ හැල හැප්පීම් මෙන්ම ජීව විද්‍යාත්මක සම්මිශ්‍රණයන් සහිතව වුව, ස්වකීය අනන්‍යතා රැක ගනිමින් ශ්‍රී ලංකාවේ වෙසෙන ජන කණ්ඩායම සම්බන්ධයෙනි. අප්‍රිකානු- ශ්‍රී ලාංකික ජනතාවගේ ඓතිහාසික ප්‍රභවය, විකාශනය, සංස්කෘතිකාංග සහ වර්තමාන ප්‍රවනතා අනාවරණය කර ගැනීම අරමුණු කරගත් මෙම අධ්‍යයනය බහුල වශයෙන් ද්විතීයක මූලාශ්‍රය පදනම් කරගනිමින් හා කෙටි කාලයත් තුළ වාර දෙකකදී පුත්තලමේ සිරම්බිඅඩි ප්‍රදේශයේ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂන පදනම් කරගත් විචාරාත්මක ගොඩනැංවීමකි. මුල් කාලීනව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ව්‍යාප්තව සිටියත්, වර්තමානය වන විට සීමිත ප්‍රදේශයකට සීමා වූ ප්‍රජා වර්ධනයක් පෙන්නුම් කරන අප්‍රිකානු ශ්‍රී ලාංකිකයින් ප්‍රමාණයෙන් කුඩා වුවත් සංස්කෘතික අනන්‍යතාවෙන් පොහොසත් ආකර්ෂණීය ජන කණ්ඩායමකි. අතීතයේදී කණ්ඩායම් ලෙස විශාල වශයෙන් මෙරටට ගෙන එන ලද අප්‍රිකානු - ශ්‍රී ලාංකික ප්‍රජාව වර්තමානය වනවිට මෙපමණ ක්ෂීණ වීමට හේතු වූ කරුණු සම්බන්ධයෙන් මානව විද්‍යාත්මක අර්ථකතනයක් සපයා දීමට මෙහිදී විශේෂ අවධානයක් යොමු කොට තිබේ.

ප්‍රමුඛ පදඃ ජන වාර්ගිකත්වය, අප්‍රිකානු-ශ්‍රී ලාංකිකයන්, ඓතිහාසික විකාශනය, සංස්කෘතිකාංග, වර්තමාන ප්‍රවණතා

[63] මෙම ලිපිය ජාතික ඒකාබද්ධතා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව, සිදු කරන ලද පර්යේෂණයක් වශයෙන් එකී අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ දී “People of Sri Lanka” නමින් පල කරන ලද කෘතියට ඇතුළත් මුල් ඉංග්‍රීසි පිටපතෙහි සිංහල පරිවර්තනය යි. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍රීය සහයෝගය ලබා දුන් කාංචනා දෙහිගම මහත්මියට සහ හේම කුමාරදාස මහතාට කතුවරයාගේ විශේෂ ස්තුතිය හිමි වේ.

[64] Senior Lecturer, Sabaragamuwa University of Sri Lanka.

**ප්‍රවේශය**

ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාව, බටහිර ජාතීන්ගේ යටත්විජිතකරණ ව්‍යාපෘතියෙහි අතුරුඵලයක් ලෙසින් ශ්‍රී ලංකාවෙහි ස්ථාපිත වූ ජන කණ්ඩායමක් බවට ඉතිහාසයෙන් කරුණු ඉදිරිපත් වෙයි (Jayasooriya and Pankhust 2001, Danver 2013). සාපේක්ෂ වශයෙන් ප්‍රමාණාත්මකව කුඩා ජනගහනයකින් සමන්විත වුවත්, ඔවුන් සතු ජීවවිද්‍යාත්මක හා සංස්කෘතික අනන්‍යතාව, දේශපාලනික ඉතිහාසය හා භෞතික පැවැත්ම බෙහෙවින් මනරම්ය; විචිත්‍රවත්ය. ඇතැම් විට ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාව තරම් ගෝලීය විසරණයට, සංස්කෘතික හැලහැප්පීම්වලට හා ජනවාර්ගික සම්මිශ්‍රණයට භාජනය වූ වෙනත් ජනවර්ගයක් ශ්‍රී ලංකාව තුළින් සොයා ගැනීම දුෂ්කර විය හැකිය. ඈත පෙරදිග (අප්‍රිකාවෙහි) සිට මෙහි පැමිණි (ගෙන ආ) මුතුන්මිත්තන්ගෙන් පැවැතෙන්නේ යයි විශ්වාස කැරෙන ස්වකීය ඉතිහාසය පිළිබඳව ඔවුන් සතුව ඇත්තේ මුඛ පරම්පරාවෙන් පැවැත එන පුරා කථා සමූහයක් පමණි. එසේ වෙතත්, විවිධ දුෂ්කරතා සහිතව වුවත්, හැකි පමණින් ස්වකීය ජනවාර්ගික අනන්‍යතාව හා සංස්කෘතික උරුමය රැක ගැනීමට ඔවුහු සමත් වී සිටිති.

සාමාන්‍ය ඉංග්‍රීසි ව්‍යවහාරයෙහි Kaffirs ලෙසත්, සිංහලයට අනුව කාපිරි[65] ලෙසත්, දෙමළ භාෂාවෙන් කාපිලි (fhgphp) ලෙසත්, හැඳින්වෙන ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාව පැවැත එන්නේ පළමුව 16 හා 17 සියවස්වල දී ප්‍රධාන වශයෙන් පෘතුගීසීන් විසිනු ද, ඇතැම් විට අරාබි වෙළෙන්දන් විසින්ද, පසුකාලීනව ලන්දේසි හා ඉංග්‍රීසින් විසින්ද මොසැම්බික් (Mozambiq) ප්‍රමුඛ නැගෙනහිර අප්‍රිකානු රටවලින් ගෘහස්ථ සේවකයන්, නාවික සහායකයන් හා ඇතැම්යිට යුද සෙබළුන් වශයෙන් ස්වකීය පාලන ප්‍රදේශවලට රැගෙන ආ ජන කණ්ඩායම් වෙතිනි (*http://www.biyokulule.com: 2016 දක්වන ආකාරයට*). විශේෂයෙන් ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාව සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඔවුන් පෘතුගීසීන් විසින් තම ගෘහස්ථ සේවකයන්, නාවික අත්උදව්කරුවන්, මෙන්ම සිංහල රජවරුන්ට එරෙහි සටන්වල දී යුද සෙබළුන් වශයෙන් යෙදවීමටත් මෙරටට රැගෙන ආ බවට සාධක තිබේ[66]. සාමාන්‍ය පැවැත්ම හා බාහිර පෙනුම සම්බන්ධයෙන් සලකා බැලීමේදී ඔවුහු ඉරාකයේ සහ කුවේටයේ වෙසෙන Zanj ප්‍රජාව සහ පාකිස්ථානයේ හා ඉන්දියාවේ වෙසෙන Sheedisවරුන් හා Siddisවරුන්ට බෙහෙවින් සමානකම් දක්වති (http://originalpeople.org: 2016). ඒ අනුව මෙකී ජන කණ්ඩායම් පෘතුගීසි හා අරාබි වෙළෙඳුන්ගේ අවශ්‍යතා මත ආසියානු කලාපයේ විවිධ ප්‍රදේශවල ස්ථාපනය කරන ලද එක් ඓතිහාසික මූලයක් සහිත සමූහ කිහිපයක් හැටියට උපකල්පනය කළ හැකිය. ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාවගේ භාෂාව පෘතුගීසි පදනමක් සහිත ක්‍රියොලයක් (creole) වන අතර, වර්තමානය වනවිට විවිධ දේශීය සංස්කෘතීන්ට අනුගත වීමත් සමඟ ක්‍රමානුකූලව භාවිතයෙන් ගිලිහෙමින් බවතී.

---

[65] ශ්‍රී ලංකාවෙහි විසූ සුප්‍රකට කවියෙකු වන Don Jeanimo Alagiyawanna (අලගියවන්න මුකවෙට්ටි) විසින් 'කුස්තන්තීනු සටන' කාව්‍ය සංග්‍රහයෙහි එන 19 වන කවියෙහි කාපිරිවරුන් හඳුන්වා ඇත්තේ 'කව්සික' යනුවෙනි.

තවද, පසුකාලීනව සිංහල රජවරුන්ගේ හමුදා හා එක් වූ කාපිරි හමුදා අනුබණ්ඩය දුම්බර පඩිකාර හේවාපන්නයට අයත් කව්සිපන්නෙ යනුවෙන් හඳුන්වන ලද බවට 1724 දී ඇහැලේපොළ අදිකාරම විසින් කව්සිපන්නෙ ලේකම වෙත නිකුත් කරන ලද ලිපියක දැක්වේ (Sunday Observer, May 8, 2008 ).

[66] මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද ට අනුව, පෘතුගීසීන් විසින් කාපිරිවරුන් ශ්‍රී ලංකාවට ගෙන ඒමට හේතු වී ඇත්තේ, එවකට පැවැති මැලේරියා වසංගතයට ඔරොත්තු දෙන ආකාරයේ ජාන ශක්තියක් ඔහුන් සතුව ඇත්තේය යනුවෙන් පැවැති විශ්වාසයයි (http://www.sundayobserver.lk/2011/05/08/fea40.asp).


කාපිරි යන පදය Kaffirs යන ඉංග්‍රීසි පදයේ දේශීය (සිංහල) අනුවාදය වන අතර, සමස්තයක් ලෙස අප්‍රිකානු මහා විල් (Grate Lakes) ප්‍රදේශ හා දකුණු අප්‍රිකානු කලාපවල ජනයා හැඳින්වීම සඳහා පොදුවේ මෙම පදය භාවිත කෙරේ. ඇතැම්විට දකුණු අප්‍රිකාවෙහි පුද්ගලයන් පහත්කොට කථා කිරීමට හා අවමන් සහගතව කථා කිරීමට මෙම පදය භාවිතයට ගැනෙන අතර, වාග් විද්‍යාඥයන් පෙන්වා දෙන ආකාරයට Kaffir යනුවෙන් ඉංග්‍රීසි භාෂාවට එක් වූ පදයෙහි මූලය අරාබි භාෂාවෙහි එන Kafir යන්නෙන් බිඳී ආවකි. එහි අර්ථය 'මිත්‍යා දෘෂ්ටිකයා' හෙවත් 'ඉස්ලාම් ආගම විශ්වාස නොකරන්නා' යන්නය (http://originalpeople.org: 2016). ඇතැම් විට ගෘහස්ථ සේවකයන් වශයෙන් අරාබි කලාපවලට රැගෙන යාමෙන් අනතුරුවත් ස්වකීය පාරම්පරික ඇදහිලි හා විශ්වාස වෙනස් කිරීමට ඔවුන් විසින් දක්වන ලද නොකැමැත්ත ඔවුන් මෙසේ හැඳින්වීමට හේතු වන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. කෙසේ වෙතත්, වර්තමානයේදීත් ඔවුන් තමන්ව හඳුන්වා ගැනීමේදී "ශ්‍රී ලාංකේය කාපිරි" හෙවත් "අප්‍රිකානු ශ්‍රී ලාංකික" යන පද භාවිත කරන්නේ අභිමානයෙනි.

ශ්‍රී ලංකාව තුළ කාපිරි ක්‍රියෝල සංස්කෘතියෙහි විකාසනය ආරම්භ වන්නේ 15 වන සියවසේ මුල් කාලයේදී දිවයින පෘතුගීසි ආක්‍රමණවලට ගොදුරු වීමෙන් අනතුරුවය. පෘතුගීසින් විසින් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ, කොළඹ, මඩකලපුව, මීගමුව, ත්‍රිකුණාමලය, ගාල්ල, හා යාපනය වැනි මුහුදුබඩ කලාප ස්වකීය ග්‍රහණයට නතුකර ගන්නා ලදි. ජනශ්‍රැතියට අනුව, මේ කාලය තුළ පෘතුගීසින් විසින් 3000 ක පමණ අප්‍රිකානු ජාතිකයන් පිරිසක් දිවයිනට ගෙන එන ලද අතර, ඉහත කී පෘතුගීසි පාලන ප්‍රදේශවල විවිධ කටයුතුවල ඔවුහු යොදවන ලදහ. ක්‍රි: වː 1501-1505 අතර ආරම්භ වූ ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලනය සියවස් එක හමාරකට මඳක් වැඩි කාලයක් පැවැති අතර, එය 1658 දී අවසන් වන්නේ ලන්දේසින් (Dutch) විසින් ඔවුන් පරාජයට පත්කොට ලාංකේය මුහුදුබඩ කලාපවල බලය අත්පත් කරගත් බැවිනි. ඉන් අනතුරුව ලන්දේසින් විසින් ද 5000ක පමණ අප්‍රිකානුවන් පිරිසක් ශ්‍රී ලංකාවට ගෙන එන ලද අතර, ඔවුහු යුද හමුදා සෙබළුන්, වැවිලි කර්මාන්තය ආශ්‍රිත වහල් සේවකයන්, බලකොටු ගොඩ නැගීම සඳහා කම්කරුවන් මෙන්ම ගෘහස්ථ සේවකයන් වශයෙන් සේවයෙහි යොදවනු ලැබූහ (http:/nation.ac 2016 දක්වන ආකාරයට). පෘතුගීසින් හා ලන්දේසින් අතර පැවැති බල අරගලවලින් පෘතුගීසින් පරාජයට පත්වීමෙන් අනතුරුව පෘතුගීසි හමුදා පලා ගිය අතර, යටත් වූ පෘතුගීසි හේවා අනුබණ්ඩවලට සම්බන්ධව කටයුතු කළ ඇතැම් අප්‍රිකානු සෙබළු ලන්දේසි හමුදාවලට එක් වූහ. ඊට අමතරව, ඇතැම් සිවිල් වැසියන් ශ්‍රී ලංකාව තුළ වැවිලි කර්මාන්තය ආශ්‍රිත සේවා සහ වෙළෙඳාම ආදී වෘත්තීන්ට අනුගතව ජීවත් වීමට පුරුදු පුහුණු වූහ (එම). ඇතැම් මූලාශ්‍රයවලට අනුව, පෘතුගීසි, ලන්දේසි හා සිංහල හමුදා අතර නිරතුරුව පැවැති යුද්ධවලින් පරාජයට පත් වූ පෘතුගීසි හා ලන්දේසි හමුදාවලට අනුයුක්තව සිටි ඇතැම් අප්‍රිකානු සෙබළු උඩරට රාජධානිය වෙත පලා ගියහ. මෙම පිරිස් සාදරයෙන් පිළිගත් කන්ද උඩරට රජවරු ඔවුන් යුරෝපීය ආක්‍රමණිකයන්ට එරෙහි සටන් සඳහා යොදාගත්හ (එම).

වර්තමානය වනවිට, ශ්‍රී ලාංකේය කාපිරි ප්‍රජාව ප්‍රධාන වශයෙන් මුහුදුබඩ ප්‍රදේශවල හා සුළු වශයෙන් සෙසු ප්‍රදේශ ඇතුළුව දිවයින පුරා විසිරී සිටිති. ඔවුන්ගේ ජනගහනය සම්බන්ධයෙන් සලකා බැලීමේදී, ස්ත්‍රී/පුරුෂ සමස්ත සංඛ්‍යාව 1000 කට පමණ සීමා වී ඇති අතර. අතිශයින්ම සෙසු ජන වර්ග තුළට අනුගත (assimilation) වීම නිසා, ස්වකීය අනන්‍යතාව බෙහෙවින්ම දුර්වල වූ

පුද්ගලයන් ද ඇතුළත්ව උපරිම වශයෙන් 1500 කට නොවැඩි සංඛ්‍යාවක් දිවයින තුළ වෙසෙතැයි විශ්වාස කෙරේ. ශ්‍රී ලංකාව තුළ කාපිරි ජනතාව ප්‍රධාන වශයෙන් පුත්තලම (සිරම්බිඅඩි), ත්‍රිකුණාමලය (පාලයි උත්තු), කල්පිටිය, මඩකලපුව, මීගමුව යන ප්‍රදේශ කිහිපයකට සීමා වී ඇති අතර, යාපනය, කොළඹ, අනුරාධපුර, බදුල්ල, ආදි ප්‍රදේශවල ඉතා සුළු පිරිසක් විසිරී සිටින බව දැකිය හැකිය. මේ අතරින්, පුත්තලම - සිරම්බිඅඩි, ත්‍රිකුණාමලය - පාලයි උත්තු, කල්පිටිය වැනි ප්‍රදේශ විශේෂ වන අතර, පොදු ඉතිහාසයකට හිමිකම් කියන හා සමාන අත්දැකීම් හා අන්තර්සම්බන්ධතා සහිත සැලකිය යුතු තරමේ කාපිරි ජන ගහණයක් එම ප්‍රදේශවල ජීවත් වෙති.

ශ්‍රී ලංකාවේ කාපිරි ප්‍රජාව ජීවත්වන භූගෝලීය කලාප




**සිරම්බිඅඩි**

පුත්තලම සිට අනුරාධපුර මාර්ගයේ කිලෝ මීටර් 5 ක් පමණ යන විට දකුණු පසට හැරෙන අතුරු මාර්ගයකින් මද දුරක් ගමන් කිරීමේදී සිරම්බිඅඩි ප්‍රදේශය හමු වෙයි. ශුෂ්ක දේශගුණික වටපිටාව ප්‍රදේශයේ පොදු ස්වභාවය වන අතර, මෙම ප්‍රදේශයේ නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ නිවාස 22 ක කට අයත් සාමාජිකයෝ ජීවත් වෙති. ප්‍රජාවට අයත් සෑම නිවසක්ම පහළ මධ්‍යම පාංතික ස්වරූපයක් ගන්නා අතර, එදිනෙදා ජීවිතය සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩවලින් සමන්විතය. ප්‍රජාවෙහි වැඩි පිරිසක් රෝමානු කතෝලික භක්තිකයන් වන අතර, වර්තමානයෙහි සිංහල ජාතිකයන් සමඟ විවාහ සබඳතා ගොඩනඟා ගත් ඇතැම් අය බෞද්ධයෝ බවට පත් වී සිටිති. ඔවුහු අසල්වැසි සෙසු ප්‍රජා කණ්ඩායම් සමඟ කුළුපග සබඳතා පවත්වාගෙන යාමට සමත් වී සිටිති.







**කාපිරි ප්‍රජාව පිළිබඳ ජනවිද්‍යාත්මක තොරතුරු**

මුල් කාලයේදී අරාබි වෙළෙඳුන් විසිනුත්, ප්‍රධාන වශයෙන් පෘතුගීසින් විසිනුත්, ඉන් අනතුරුව ලන්දේසීන් විසින් හා පසු කාලයේදී ඉංග්‍රීසින් විසිනුත් වරින්වර ශ්‍රී ලංකාවට රැගෙන ආ කාපිරිවරුන්ගේ ජන සංඛ්‍යාව (නිශ්චිත සංඛ්‍යා ලේඛන නොමැති වුවත්), ස්වාභාවික වර්ධනයද සැලකිල්ලට ගත් කල ඔවුන්ගේ ප්‍රමාණය දිවයින තුළ ඊට වඩා විශාල අගයක් ගතයුතු බව විමර්ශනාත්මකව බලන විට පෙනී යයි. ඇතැම් ඉතිහාසඥයන් දක්වන ආකාරයට (Jayasuriya and Pankhurst, 2001), තත්කාලීනව ශ්‍රී ලංකාවට ඇතුළු වූ නෞකාවලින් ගොඩබට 20,000 ක් පමණ වූ පිරිස අතරින් පෘතුගීසින් වූයේ 1000 ක පමණ පිරිසක් පමණි. සෙස්සෝ ආසියානු හා අප්‍රිකානු පෘතුගීසි යටත් විජිතවල ස්වදේශික ජන වර්ගවලට අයත් වූහ. ඔවුන් කවර ජනවර්ගවලට අයත් වූවන්ද යන බවට නිශ්චිත නැතත් සැලකිය යුතු පිරිසක් අප්‍රිකානු සම්භවයක් සහිත වූවන් බව

අනුමාන කෙරේ. ශ්‍රී ලංකාව තුළදී පෘතුගීසින් පරාජයට පත්කොට මුහුදුබඩ ප්‍රදේශ සිය පාලනයට නතුකර ගත් ලන්දේසීන් විසින් අනතුරුව 16 වන සියවසේදී විශේෂයෙන් 1658 වසරේදී ස්වකීය යුද හමුදාමය අවශ්‍යතා සඳහා 5000 ක පමණ අප්‍රිකානුවන් පිරිසක් රැගෙන එන ලදි. (http://www.sundayobserver.lk/2011). එසේම ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලනය අවසන් වීමෙන් පසුව 18 වන සියවසේදී ඉංග්‍රීසින් විසින් ස්වකීය කාපිරි රෙජිමේන්තුව (Kaffir's Regiment) සැකසීම සඳහා 6000 ක අප්‍රිකානුවන් පිරිසක් යොදවා ගත් බව දැක්වේ (එම). එසේනම්, වර්තමානය වනවිට ඔවුන්ගේ ජන සංයුතිය මෙපමණ අඩු අගයක් ගැනීමට තුඩුදුන් හේතු විමසා බැලීම ප්‍රයෝජනවත් වේ.

දිවයින තුළ කාපිරි ජනගහනය හීන වීමට බලපාන ලද සාධක ඓතිහාසික කරුණු උපකල්පන මත කිහිප ආකාරයකින් පෙළ ගැස්විය හැකිය. 1845 දී ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය විසින් ගෙනඑන ලද වහල් සේවය අත්හිටුවීමේ පනත (Slavery Abolishing Act) ක්‍රියාත්මක වීමෙන් අනතුරුව 9000 ක් පමණ වූ අප්‍රිකානු සෙබළුන් නිදහස් වූ බව දැක්වේ (එම). ඉන් අනතුරුව ඔවුන්ගෙන් ඇතැමෙක් තව දුරටත් ස්වකීය හාම්පුතුන් සමඟ හෝ තම අභිමතයට අනුව හෝ රටින් බැහැර වන්නට ඇතැයි සිතිය හැකිය. එසේම, පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආණ්ඩු යටතේ ඔවුන්ගේ යුද හමුදාවලට සම්බන්ධව සිටි අප්‍රිකානු සෙබළුන් සැලකිය යුතු පිරිසක් ශ්‍රී ලාංකේය රජවරුන්ට එරෙහි සටන්වලදී මියගිය බවට සාධක තිබේ. ඓතිහාසික සිංහල-පෘතුගීසි සටන් හැටියට සැලකෙන 1562 මුල්ලේරියා සටන, 1630 රන්දෙණිවෙල සටන, 1638 ගන්නෝරුව සටන මේ අතරින් ප්‍රධාන වේ. විශේෂයෙන් සිංහල හමුදා වෙතින් පෘතුගීසින් බෙහෙවින් පහර කෑමට ලක් වූ රන්දෙණිවල සටනින් අනතුරුව මහත් අභිමානයෙන් සිටි සිංහල හමුදා කොළඹ කොටුව අත්පත්කරගැනීම සඳහා පෙළ ගැසෙද්දී පිරිහී තිබූ පෘතුගීසි බලය තහවුරු කර ගැනීම සඳහා ගෝවෙන් වෙනම කාපිරි හමුදාවක් ගෙන ඒමට සිදු වූ බව ඉතිහාසයේ සඳහන් වේ. මීට අමතරව, ලන්දේසි හා ඉංග්‍රීසි පාලන කාලවලදී විවිධ මාදිලියේ සටන් හා කැරලි වර්ධනය විය. එම සටන් සඳහා ද කාපිරි හමුදාවන්ගේ සහාය ලබා ගන්නා ලදි. ඒ මඟින් ද සැලකිය යුතු කාපිරිවරුන් ප්‍රමාණයකගේ දිවි තොර වන්නට ඇතැයි සිතිය හැකිය. විශේෂයෙන් රන්දෙණිවල සටනින් පසු පෘතුගීසින් සතුව ඉතිරිව සිටි කාපිරිවරුන්ගේ සංඛ්‍යාව 184 ක් පමණක් බව සඳහන් වීමෙන් ඔවුන්ට අත් වූ ව්‍යසනය තව දුරටත් තහවුරු වෙයි. (Jayasuriya and Pankhurst, 2001).

ශ්‍රී ලංකාවේ ලන්දේසි ආණ්ඩුකාර Van Goyans (Junior) සටහන් තබා ඇති ආකාරයට තත්කාලීනව 4000 කට වැඩි කාපිරි ජනගහනයක් මෙරට ජීවත්ව සිට ඇත. ශ්‍රී ලංකාව තුළ ස්වකීය පාලකයන්ට එරෙහිව සිදු වූ කාපිරිවරුන්ගේ නැඟී සිටීම් කිහිපයක් වාර්තාවන අතර, විශේෂයෙන් ලන්දේසි ආණ්ඩුකාර Isaac Rumph විසින් ස්වකීය පාලනයට එරෙහි එවන් කැරැල්ලක් දරුණු ලෙස මර්දනයට ලක් කළ බවත් එයින් කාපිරිවරුන්ට විශාල වශයෙන් ස්වකීය දේපළ හා ජීවිත අහිමි වූ බව සඳහන්ය (http://www.sundayobserver.lk/2011/05/08/fea40.asp). එසේම, කාපිරි කැරලිකරුවන් විසින් ලන්දේසි නිලධරයෙකු වූ BarrantVandor Steron හා ඔහුගේ බිරිඳ ඝාතනය කිරීම නිසා ලන්දේසීන් විසින් එම ප්‍රජාව දැඩි ලෙස මර්දනයට ලක් කරන ලද බව දැක්වේ (එම). ස්වාභාවික ලෙඩරෝග හා වියපත් වීම ආදියද වහල් සේවය සඳහා යොදා ගත් කාපිරිවරුන්හට බෙහෙවින් වේදනා සහගත අත්දැකීමක් වූ බවට සැක නැත. වර්තමානයේදී කොළඹ

කොම්පඤ්ඤවීදිය යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශය තත්කාලීන ව්‍යවවහාරය තුළ ‘Slave Island’ ලෙස හඳුන්වන ලද අතර (වර්තමාන ඉංග්‍රීසියෙහි භාවිත වන්නේ ද Slave Island යන්නය), රෝගී හා වියපත් කාපිරිවරුන් රඳවා තැබීමට එම ප්‍රදේශය භාවිත කළ බවට ඓතිහාසික කරුණු ඉදිරිපත් වේ (http://www.telegraph.co.uk 2016). තවද, සමූහ වශයෙන් කාපිරි ප්‍රජා කණ්ඩායම් ජීවත් වූ ප්‍රදේශ (උදාඃ සිරම්බිඅඩි, ත්‍රිකුණාමලය හා කල්පිටිය) හැරුණු විට හුදෙකලා පුද්ගලයන් වශයෙන් රැකියා හා වෙනත් හේතු නිසා දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලට සංක්‍රමණය වූවන් ආවාහ විවාහ මඟින් අනුගත වී ඇත. ඔවුන් සතු ජන වාර්ගික අනන්‍යතා පිළිබඳ කිසිදු සටහනක් නොතබාම පහසුවෙන් සිංහල, දෙමළ හා බර්ගර්වරුන් වැනි සෙසු ප්‍රධාන ජන වර්ග සමග ඇතිකරගන්නා ලද අන්තර්විවාහ සම්බන්ධතා මඟින් ඔවුන්ගේ නම් හා වාසගම් පවා ඒ ඒ ජන වර්ග වෙතට අවශෝෂණය වී ඇති අතර තව දුරටත් එසේ සිදු වෙමින් පවතින බවට සාක්ෂි හමු වේ. මේ ආකාරයේ විවිධ සාධක හේතුකොට ශ්‍රී ලාංකේය කාපිරි ජනගහනය වර්තමානයේ පවතින තත්ත්වයට පත් වන්නට ඇතැයි සඳහන් කළ හැකිය.

ශ්‍රී ලාංකේය කාපිරිවරුන් සම්බන්ධ ඓතිහාසික ජනවිද්‍යාත්මක සාධක සම්බන්ධයෙන් සලකා බැලීමේදී, 1870 කාලයේ පටන් ඔවුන් පිළිබඳ විද්‍යාත්මක සංඛ්‍යා දත්ත ප්‍රකාශ වී තිබෙයි. ඔවුන් සම්බන්ධ සංඛ්‍යා ලේඛන ස්ත්‍රී හා පුරුෂ වශයෙන් ලිංගිකත්වය අනුවද වාර්තාගතව තිබීම මෙහි ඇති විශේෂත්වයයි.

වගුව - 01

| වර්ෂය | දිස්ත්‍රික්කය | ජනගහනය |
|---|---|---|
| 1973 | කොළඹ | 40 |
| | කුරුණෑගල | 20 |
| | පුත්තලම | 70 |
| | මහනුවර | 43 |
| | බදුල්ල | 17 |
| | ත්‍රිකුණාමලය | 30 |
| 1881 | කොළඹ නාගරික | 73 |
| | නගරසීමාව හැර කොළඹ | 16 |
| | මීගමුව | 18 |
| | කළුතර | 10 |
| | කුරුණෑගල | 11 |
| | පුත්තලම | 101 |
| | මහනුවර | 55 |
| | බදුල්ල | 19 |
| | නුවර එළිය | 46 |
| | නුවර කලාවිය ද ඇතුළත්ව තමන්කඩුව | 12 |
| | ත්‍රිකුණාමලය | 31 |

| | | |
|---|---|---|
| | ගාල්ල | 10 |
| 1892 | කොළඹ නාගරික | 71 |
| | කුරුණෑගල | 20 |
| | පුත්තලම | 115 |
| | මහනුවර | 63 |
| | නුවර එළිය | 24 |
| | බදුල්ල | 22 |
| | නුවර කලාවිය | 20 |
| | ත්‍රිකුණාමලය | 39 |
| 1901 | කොළඹ | 60 |
| | මහනුවර | 49 |
| | ගාල්ල | 14 |
| | කුරුණෑගල | 21 |
| | පුත්තලම | 93 |
| | හලාවත | 13 |
| | අනුරාධපුරය | 25 |

දත්තඃ ([Williams 1873: 100], Jayasuriya, 2008: 164)
([Lee 1882], (Jayasuriya, 2008: 164])
([Lee 1982], Jayasuriya, 2008: 165)

සෙසු දිස්ත්‍රික්කවල සුළු වශයෙන්ද වාර්තා වී තිබෙයි. කෙසේ වෙතත් එවකට ශ්‍රී ලංකාව (Ceylon) පදනම් කරගත් වෙළෙඳ නැව්වල සේවය සඳහා යොදවන ලද දහස් ගණනක් වූ අප්‍රිකානුවන් හා අනිවාර්යයෙන්ම යටත් විජිත පාලන සමයෙහි යුද සේවයෙහි නියුක්ත වූවන් මෙම ජන සංගණනවලට ඇතුළත්ව නොතිබීම සංඛ්‍යාලේඛනවල බලවත් දුර්වලතාවකි..

මෙම ජනගහනය ස්ත්‍රී/පුරුෂ අනුපාතයට අනුව ඒ ඒ වර්ෂවලදී වාර්තාගත වී ඇති ආකාරය පහත වගුවෙන් දැක්වෙයි.

වගුව - 02

1873, 1892, 1892 වර්ෂවලදී දිවයිනේ

කාපිරි ජනගහනය ලිංගිකත්වය අනුව

| වර්ෂය | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|
| 1873 | 113 | 132 | 245 |
| 1892 | 204 | 204 | 408 |
| 1901 | 152 | 166 | 318 |

දත්තඃ Jayasuriya, Shihan de Silva and Jean-Pierre Angenot 2008. [Williams 1873: 100], [Lee 1882], Uncovering the Histiry of Africans in Asia, Leiden; Boston, Brill.

**ශාරීරික ලක්ෂණ**

කාපිරි ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වයම සාමාන්‍යයෙන් ශක්තිමත් හා සාපේක්ෂ වශයෙන් උස් වූ මෙන් ම මනාව වැඩුණු ශාරීරික ලක්ෂණයන්ගෙන් යුක්ත වූවෝ වෙති. ප්‍රජාවෙහි වැඩි පිරිස කුඩා කැරලි ගැසුණු හා ඝනව වැඩුණු කෙස් කළඹකින් යුතු වන අතර, තරමක් ඝන දෙතොල්වලට උරුමකම් කියති. සමෙහි වර්ණය සම්බන්ධයෙන් සලකා බැලීමේදී, තවමත් බහුල වශයෙන් ස්වකීය අප්‍රිකානු සම්භවයෙහි මුල් ස්වරූප සහිත වූවෝ අඳුරු වර්ණ සමකට උරුමකම් කියති. එසේ වුවත්, දිගු කලක් මුළුල්ලේ සෙසු ජන වර්ග, විශේෂයෙන් සිංහලයන් සමඟ මිශ්‍ර වීම නිසා, ප්‍රවේණිගත ශාරීරික ලක්ෂණ හා ඡවි වර්ණය ඔවුන් වෙතින් බැහැර වෙමින් පවතිනු දැකිය හැකිය. විශේෂයෙන් වර්තමානය වන විට ඔවුන් අතර බෙහෙවින් තලඑළළු පැහැයෙන් යුතු කුඩා දරුවන් දැකිය හැකිය.

රැකියා හා ජීවන තත්ත්වය

ශ්‍රී ලංකාවේ ප්‍රභූ තන්ත්‍රය හා සෙසු ඉහළ වෘත්තිමය අංශයන්හි කැපී පෙනෙන කාපිරි නියෝජනයක් දැකිය නොහැකි වුවද, ඔවුන් අතරින් සැලකිය යුතු පිරිසක් විශේෂයෙන් පිරිමින්, ශ්‍රී ලංකා ආරක්ෂක අංශවලට සම්බන්ධව සේවා සපයනු ලැබෙයි. ඇතැම් අධ්‍යයනවලට අනුව, හේන් ගොවිතැන ශ්‍රී ලාංකේය කාපිරිවරුන් අතරින්, විශේෂයෙන් සිරම්බිඅඩි වාසීන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත්ව ඇත. (www. lankalibrary.com: 2016). සාම්ප්‍රදායික හේන් ගොවියන් වශයෙන් ඔවුන් පිළිබඳ ඓතිහාසික සඳහනක් නොමැති වුවද, ඔවුන් පුත්තලම සිරම්බිඅඩි වැනි ග්‍රාමීය ප්‍රදේශයක පදිංචියට පැමිණීමෙන් අනතුරුව, ප්‍රදේශවාසීන්ගේ ජීවන ශෛලියට අනුරූප වීම හේතුවෙන් හේන් වගා සඳහා නැඹුරු වූවා විය හැකිය. මෙයට අමතරව, සිරම්බිඅඩි වාසීන් අතරින් ඇතැමෙක් පුත්තලම ලුණු ලේවාය, පුත්තලම රජයේ රෝහල ඇතුළුව ප්‍රදේශයේ ඇතැම් රජයේ සහ පෞද්ගලික අංශයේ කාර්යාලවල කම්කරු හා කාර්යාල කාර්ය සහායක වැනි රැකියාවල නියැළෙති. සිරම්බිඅඩිවාසීන්ගෙන් වැඩි පිරිසක් එදිනෙදා ජීවන මාර්ග සලසා ගැනීම සඳහා නිශ්චිත නොවූ විවිධ ශ්‍රමික කාර්යයන්හි නියැළෙති.

**ඇඳුම් පැළඳුම්**

කාපිරිවරුන් අතර මුල් කාලයේ සිටම ප්‍රචලිත ඇඳුම් මෝස්තර සාම්ප්‍රදායික පෘතුගීසි හා ලන්දේසි ආභාසය සහිත ඒවා වෙති. විශේෂයෙන් කාන්තාවන් අතර ජනප්‍රිය ඇඳුම් මෝස්තරයවන්නේ සාම්ප්‍රදායික පෘතුගීසි ඇඳුම් සිහිපත් කරන, දෙපයෙහි ඇස්වටය තෙක් දික්වන පරිදි අඳිනු ලබන කිමෝනා (Kimona) නැමැති ගවුම් විශේෂයකි. උත්සව අවස්ථාවන්හි තනි වර්ණවලින් සමන්විත හා දිගු දෑත් සහිත කිමෝනාවලින් සැරසී සිටීමට කැමැත්තක් දක්වන ඔවුහු, එදිනෙදා ගෘහ ජීවිතයේදී විවිධ රටා හා මෝස්තරයන්ගෙන් සමන්විත, කෙටි දෑත් සහිත, වඩා සැහැල්ලු කිමෝනා අඳිති. සිරම්බඩිඅඩිහිදී හමු වූ ඇතැම් කාන්තාවන්, විශේෂයෙන් වියපත් කාන්තාවන් දේශීය ග්‍රාමීය කාන්තාවන්ගේ ආභාසය අනුව, චීත්ත හා හැට්ට ඇඟ ලා සිටිනු දැක ගත හැකි විය. කාන්තාවෝ විශේෂයෙන් සිය ඝන හා කෙටි කෙස් කළඹ හිස පිටුපසට වන්නට තදින් බැඳ තබා ගැනීමට පුරුදුව සිටිති. ඔවුහු උත්සව අවස්ථාවලදී තරමක් විශාල තෝඩු පැළඳ සිටීමට කැමැත්තක් දක්වති. වර්තමානයේදී පුරුෂ පාර්ශ්වය භාවිත කරන ඇඳුම් පැළඳුම්, ශ්‍රී ලංකාවේ සෙසු ජනවර්ගයන්ට අයත් පිරිමින්ගේ ඇඟළුම්වලින් කැපී පෙනෙන තරමේ වෙනස්කම් ප්‍රදර්ශනය නොවන නමුත්, තද වර්ණයන්ගෙන් යුත් ඇඳුම් ඔවුන් අතර වඩා ජනප්‍රිය බව පෙනේ.

**සංස්කෘතික ලක්‍ෂණ**

ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි වර්ණවත්භාවය හෙවත් විවිධත්වය වෙනුවෙන් කාපිරි ප්‍රජාවගේ දායකත්වය සුවිශේෂ වේ. සංඛ්‍යාත්මක  වශයෙන් කුඩා පිරිසක් වුවද ඔවුන්ගෙන් මෙරටට දායාදව ඇති සංස්කෘතික උරුමයන් ඓතිහාසික යුද තාක්‍ෂණයේ පටන් සංගීතය හා ගායනා දක්වා පුළුල් පරාසයක විසිර පවතී. උදාහරණ වශයෙන්, ශ්‍රී ලාංකේය පැරණි යුද උපකරණ අතරට අසගය (Assagai) භාවිතය හඳුන්වා දෙනු ලබන්නේ කාපිරි යුද සෙබළුන් විසිනි. මෙය යම් තරමකින් හෙල්ලට සමාන (එහෙත් හෙල්ලය නොවේ) ලී මිටක් සහ තියුණු තුඩක් සහිත, දුර සිට සතුරා වෙත එල්ල කළ හැකි උපකරණයකි. ඔවුහු යුද අවස්ථාවලදී මෙය භාවිත කිරීමට බෙහෙවින් හුරුබුහුටි වූහ. ශ්‍රී ලංකාවේ යටත් විජිත සමයන්හි ක්‍රියාත්මක වූ ගොඩනැඟීම් කර්මාන්තය ආශ්‍රිතව කාපිරි ප්‍රජාවගෙන් ලැබුණු ශ්‍රම දායකත්වය සුළුපටු නොවේ. බලකොටු ඉදිකිරීම, නැව් හැසිරවීම් හා අලුත්වැඩියා කිරීම්, හා දුම්රිය මාර්ග සැකසීම් ආදිය සඳහා ශ්‍රම දායකත්වය සැපයිම මේ අතරින් ප්‍රධාන වෙති (Jayasuria, 2001). විශේෂයෙන් වර්තමානයේ ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාල්ල කොටුව, මෙන්ම යටත් විජිත යුගයේ සෙසු ඉදිකිරීම් වන කොළඹ, යාපනය ආදී බලකොටු ඉදිකිරීම් සඳහා බහුල වශයෙන් කාපිවරුන්ගේ ශ්‍රමය යොදාගත් බවට සාක්‍ෂ්‍ය හමු වේ (එම).

කාපිරිවරුන්ට ආවේණික වූ හා සුවිශේෂතම අංගය නම්, ඔවුන් සතු ක්‍රියෝල භාෂාව (Portuguese-Creole) හා ඒ ආශ්‍රිත සංස්කෘතියයි. ඔවුන් සතු පෘතුගීසි ආභාසය සහිත ක්‍රියෝල භාෂාව ලේඛන මාධ්‍යයට නොපැමිණි, හුදෙක් කථා ව්‍යවහාරය සඳහා පමණක් භාවිත වූවකි (Kohl, 2012). මුල්දී පෘතුගීසින් හා කාපිරිවරුන් අතර අදහස් හුවමාරුව සඳහා භාවිත වූයේ යැයි විශ්වාස කළහැකි ක්‍රියෝල භාෂාව පසුකාලීනව දේශීය සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා සමඟ අදහස් හුවමාරුව සඳහා ද භාවිතයට ගැනිණ.

18 වන සියවස අග භාගය තුළ සිට අන්තර්ජනවාර්ගික හා පරිපාලනමය භාෂා මාධ්‍යය ලෙස ඉංග්‍රීසි භාෂාව හඳුන්වා දෙන තුරු ම ඔවුන් හා සෙසු ජන වර්ග අතර අදහස් හුවමාරුව සඳහා භාවිත වූයේ ඔවුන් සතු ක්‍රියෝල ව්‍යවහාරයයි. ශ්‍රී ලංකාවේ සෙසු ජන වර්ගයන්ට සාපේක්‍ෂව කාපිරිවරුන් ඉතා හොඳින් සංගීතය, ගායනය හා නර්තනය ස්වකීය එදිනෙදා ජීවිතය හා බද්ධ කරගත් ප්‍රජාවක් ලෙස හැඳින්විය හැකිය. එදිනෙදා ජීවිතයෙහිදී එළඹෙන විවිධ උත්සව අවස්ථා සඳහා නිරතුරුව සිදුවන සාද පැවත්වීම් සඳහා මෙකී කලා අංග ප්‍රායෝගිකව යොදා ගැනේ. මේවා ශාස්ත්‍රියමය වශයෙන් සලකා බැලීමේදී එතරම් ගැඹුරු නිර්මාණ ලෙස සැලකිය නොහැකි වෙතත්, එදිනෙදා ජීවිතයේදී මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා අමතක කර දැමීම හා වින්දනීය සංතෘප්තිය ළඟා කර ගැනීම යන කාරණා සම්බන්ධයෙන් ඔවුන්ගේ ගායනා හා නර්තන බෙහෙවින් ඉදිරිගාමී වන බව පෙනේ.

පුත්තලම සිරම්බිඅඩි ප්‍රදේශයේදී මෙම ලේඛකයාට ප්‍රදේශයේ කාපිරි ප්‍රජාවට අයත් සංගීතමය විවිධ ප්‍රසංගයක් නැරඹීමට අවස්ථාව සැලසිණි. පෘතුගීසි ෆැඩෝ (Fado) සංගීතය හා අප්‍රිකානු මංජා (Manja) (හෙවත් පෘතුගීසි බසින් Manha) නමින් හැඳින්වෙන සංගීතයන්ගේ එකමුතුවක් වන කපිරිඤ්ඤා[67] (Kapffirinha) නර්තනය ස්ත්‍රී, පුරුෂ, බාල, මහලු සියලු දෙනා එක්ව ප්‍රාසාංගික ලෙස

[67] කපිරිඤ්ඤා සංගීතය ආභාසයෙන් 1940 දශකයේ සිට ශ්‍රී ලංකාව තුළ බයිලා ('Baila') යනුවෙන් වෙන ම කලා මාධ්‍යයක් වර්ධනය වන්නට විය. බයිලා යන පදය ස්පාඤ්ඤ භාෂාවෙහි එන 'Bailar' යන්න දේශීය උච්ඡාරණයට අනුව

ඉදිරිපත් කැරෙන චිත්තාකර්ෂණීය කලා අංගයකි. වර්තමානයේදී ‘Ceylon-Africa Manja’ යනුවෙන් සංගීත කණ්ඩායමක් සංවිධානය කරගෙන සිටින ඔවුහු ඇතැම්විට ආරාධිත ප්‍රසංග සඳහා සහභාගි වෙති. අතිශයින් ප්‍රාසාංගික ස්වරූපයක් ගන්නා මංජා ඉදිරිපත් කිරීම් බෙහෙවින් නිදහස් ප්‍රවේශයක් ගන්නා අතර, ඒ සඳහා ඔවුන් භාවිත කරන සංගීත මෙවලම්, ඔවුන් ගෝලීය සමාජ ප්‍රවාහය තුළ විවිධ සංස්කෘතික සම්මිශ්‍රණයකට (blendingpot) භාජනය වී ඇති බවට කදිම සාධකයකි. ගායනය, වාදනය, නර්තනය යන ත්‍රිත්වයටම බාල, මහලු, ස්ත්‍රී, පුරුෂ සියලු දෙනා එක සේ සහභාගි වෙති. විශේෂයෙන් කාන්තාවන්ගේ නර්තන දායකත්වය, ඇතැම් විට කාන්තාවන් එවැනි ක්‍රියාකාරකම්වලින් ඈත් කර තැබීමට හේතු වී ඇති "ලජ්ජා" සංකල්පය පදනම් කරගත් දකුණු ආසියානු සංස්කෘතික පරමාදර්ශවලට ප්‍රතිපක්ෂව යන්නකි (http://www.sundaytimes.lk: 2016). අප්‍රිකානු ජන සම්ප්‍රදාය නියෝජනය කරමින් දේශීයව සපයාගත් ප්‍රාථමික උපකරණ වන, මේස හැඳි, පොල් කටු, හිස් බෝතල් ආදිය මෙන්ම, අන්තර්මහාද්වීපික සංගීත භාණ්ඩ ලෙස ගත හැකි වයලීන, මැන්ඩලීන, ඩොලැක්කි, රබන්, ස්පාඤ්ඤ ගිටාර, දේශීය බෙර ආදිය පොදුවේ සියලු දෙනා විසින් වාදනය කරනු ලැබීම දැකිය හැකිය. විදග්ධ ස්වරූපයෙන් බැහැර, ගැඹුරු සාහිත්‍යමය අර්ථ රහිත ඔවුන්ගේ ගී පද සංගීත රිද්මයට සමගාමීව සැකසුණු, පුනරුක්ති බහුල ඒවා වෙති. මේවා ඔවුන් එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන, දුක, වේදනාව, සතුට, ආදරය හා පාරිසරික අංග වන, මුහුද, සතුන්, සොබාදහම, කුරුල්ලන් ආදිය තේමා කොට ගත් සරල අර්ථ සහිත ඒවා වෙති (එම). සාමාන්‍යයෙන් මන්දස්වරයෙන් පටන් ගන්නා ගීත අවසන් වන්නේ ප්‍රවේගකාරී නර්තනයට යෝග්‍ය පරිදි ක්‍රමයෙන් වේගවත්වන රිද්මයන්ගෙන්ය. එවැනි අවස්ථාවලදී ප්‍රේක්ෂක ප්‍රතිචාරයෙන් ප්‍රමෝදයට පත්වන ඔවුහු, සමූහ ගායනය සහ නර්තනය සඳහා සහභාගි වන ලෙස ප්‍රේක්ෂකයන්ට ආරාධනා කරති. සෑම ගීතයක් ම පාහේ පද වැල් 6-7 කට පමණක් සීමා වුවද, විවිධ රිද්මයන්ගෙන් එකම පද ගායනා කරමින් හා ආලාප, කෑ ගැසීම් හා අත්පොලසන් ආදිය ඇතුළත්ව එකම ගීය වුව දිගු වේලාවක් ගායනා කිරීමේ හැකියාවෙන් යුක්තය. සාමාන්‍යයෙන් කණ්ඩායමේ කිසිවෙකුත් පෙරදිග, බටහිර හෝ වෙනත් කිසිදු සංගීත සම්ප්‍රදායක් සම්බන්ධ අවබෝධයකින් හෝ පුහුණුවකින් යුක්ත නොවුණ ද, සෑම නිවසකම පාහේ තැම්බරීන (Tambourine), ගිටාර් (Guitar) ආදී කිසියම් හෝ සංගීත භාණ්ඩයක් තිබීම සුලබ දසුනකි. ගීතවල සම්පූර්ණ අර්ථය ප්‍රකාශ කිරීමට තරම් භාෂාත්මක අවබෝධය නොමැති වුවත්, තම පරම්පරාවෙන් පැවැත එන මංජා ගීත 35-40 ක ප්‍රමාණයක් තමන් සතුව මතකයේ පවතින බව එහි සාමාජිකාවක වන ජුලියට් ජොසපින් ප්‍රකාශ කළාය.

මදුරා චිකා චිකා මිනේලා
මිඤ්ඤ කාවො යවන්ඩ රෙකාදු
අවන සින්නදු

චෝ චෝ චෝ චෝචු කුඩයි
කිනම් පඩායා
වෙදේ සොඳයි නා මුරායා
වෙඬේ මුරායා

සකස් වූවක් වන අතර, එය ශ්‍රී ලංකාව තුළ කිසියම් ගායනා ශෛලියක් වශයෙන් වර්ධනය වුවද ස්පාඤ්ඤය, පෘතුගාලය ආදී කලාපය තුළ එය ගොඩනැගුණේ සංගීතය සමඟ මුසු වූ නර්තන සම්ප්‍රදායයක් වශයෙනි. 1970 දශකය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රසංග වේදිකා ආශ්‍රිතව එළිදැක්වුණු විවිධ ඌරුවට අයත් බයිලා පොදු ජනයා අතර බෙහෙවින් ජනප්‍රිය වූ කලා අංගයක් විය. ඒ සඳහා සුප්‍රකට හා ප්‍රවීණ බයිලා ගායක සමූහයකගේ දායකත්වය ලැබිණ.

මදුරා ගමෙන් යන මගේ දුවේ

මදුරා ගමේ ඉඳන්
දීගෙක යන මගේ දුවේ
ඔබ සුරතේ ඇති මුද්ද වගේ
රැක ගන්නකො
සොඳ පවුල ඔබේ

අයෝ ලූමාරා - ඉස්ත්‍රෙලත දියන්තේ
මිස්ඤ්ඤ ලූමාරා - ඉස්ත්‍රෙලත දියන්තේ
සරුංගලත පිඩ්මේන්තු
මමා ඔස ගසමේන්තු

සරුංගලයක් හදා දෙන්න අම්මේ
ලස්සන සඳ තරු පායනා
දිදුලන දේදුන්න පායනා
මඟුල් ගෙයක් වන් අහසට යවන්න
අම්මේ මට සරුංගලයක් හදලා දෙන්න

මංජා සංගීත කණ්ඩායමේ සාමාජිකාවක වන ෂෙරින් (50) විසින් තමන් ගයන ගීත දෙකක් සඳහා තම අවබෝධයේ පමණට පද අරුත් සපයා දුන්නාය. ඒ අනුව, අප විසින් ඉහත ආකාරයෙන් ඒවායෙහි ඡායානුවාදය සකසන ලදි.

**සමාලෝචනය**

ශ්‍රී ලාංකේය කාපිරි ජනතාව විවිධ සමාජීය, ආර්ථික, භූගෝලීය හා කාලීන වෙනස්කම්වලට ලක්වෙමින් ඉතා දිගු කලක සිට ශ්‍රී ලංකා භූමිය තුළ ජීවත් වෙති. ඔවුන් සතු විවිධ සංස්කෘතික අනන්‍යතා හා කුසලතා ශ්‍රී ලංකා සමාජය විචිත්‍රවත් කිරීමට දායක වී ඇතිවා සේම, සියලු ජන වර්ග විසින් ඒවා ඉතසිතින් පිළිගෙන තිබේ. ශ්‍රී ලාංකිකයන් විසින් මෙම ප්‍රජාව කාපිරි යන පදයෙන් හඳුන්වනු ලැබුවද, එය පොදු ජන විඥානය තුළ තැන්පත්ව ඇත්තේ හෙළා දැක කථා කිරීමේ අර්ථ සහිතව නොවේ. ඔවුහු අසල්වැසි ප්‍රජාව සමඟ බෙහෙවින් සුහදශීලීව කටයුතු කරන අතර, එදා මෙදාතුර කවර සංස්කෘතික හා දේශපාලනික කැලඹීම් සහිත තත්ත්ව තුළ වුවද ඔවුන් වෙත බාහිර සමාජයෙන් සුවිශේෂ පීඩනයක් එල්ල නොවූ බව ඔවුන්ගේ අදහසය. වර්තමානය වන විට කාපිරි ප්‍රජාව යම් යම් ජීවවිද්‍යාත්මක ගති ලක්ෂණ හැරුණු විට මුළුමනින්ම ශ්‍රී ලාංකේය ජන සමාජයට අනුගත වී සිටිති. ජීවවිද්‍යාත්මක වශයෙන් හෝ සංස්කෘතිකමය වශයෙන් සෙසු ප්‍රජාව සමඟ සම්මිශ්‍රණය වීම හෝ නොවීම කාලය හා අවස්ථාව මත පදනම්වන පුද්ගල නිඃශ්‍රිත සංසිද්ධියකි. ඔවුන්ගේ රුචිකත්වයට අනුව, ස්වකීය අනන්‍යතා ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කර ගැනීමට දායක වීම පාලන තන්ත්‍රයේ වගකීමය. මෙම ප්‍රජාව සම්බන්ධයෙන් අන්තර්ජාලය ආශ්‍රිතව වාර්තාමය විස්තර බහුලව ඇතත්, ශාස්ත්‍රීමය පදනමක් සහිත අධ්‍යයන දුලබය. ඒ සම්බන්ධයෙන් විද්‍යාර්ථීන්ගේ හා පර්යේෂකයන්ගේ අවධානය යොමු වීමද කාලීන අවශ්‍යතාවක් බවද මෙහිදී සඳහන් කළ යුතුය.

## ආශ්‍රේය මූලාශ්‍රය


Danver, Steven L. (2013). Native People of the World: An Encyclopedia of Groups, Cultures and Contemporary Issues, Vol.1-3, London and Newyork, Routledge, Tylors Francis Group: 535.

Jayasuriya, Shihan de Silva and Jean-Pierre Angenot (2008).Uncovering the Histiry of Africans in Asia, Leiden; Boston, Brill.

Jayasuriya, Shehan de Sila and Richard Pankhust (2001).The African Diaspora in the Indian Ocean, Trenton N.J., Affrica World Press.

Kohl,Christoph (2012). Luso-Creole Culture and Identity Compared: The Case of Guinia Bissau and Sri Lanka. (Open Access) https://www.berghahnbooks.com/downloads/OpenAccess/KnoerrUpper/KnoerrUpper_02.pdf (2016, 09.10)

Kooda, Marryanne (2016)."WWW Virtual Library Sri Lanka : Kaffirs in Sri Lanka - Descendants of enslaved Africans". Lankalibrary.com. (Retrieved 2016-06-10.)

http://originalpeople.org/video-kaffir-culture-in-sri-lanka-india/(Retrieved, 2016-05-14.)

http://www.telegraph.co.uk/expat/expatnews/6613354/Where-kaffir-is-no-insult.html(Retrieved, 2016-05-14.)

http://www.biyokululе.com/view-content.phparticle 5619 (Retrieved, 2016-05-10.)

http://www.sundaytimes.lk/090726/Plus/sundaytimesplus_01.html(Retrieved, 2016-05-14.)

http://www.bordermovement.com/kaffir-culture/(Retrieved, 2016-06-14.)

http://nation.sc/article.html?task=pdf&id=241335(Retrieved, 2016-06-14.)

http://www.sundayobserver.lk/2011/05/08/fea40.asp(Retrieved, 2016-07-05.)


http://originalpeople.org/video-kaffir-culture-in-sri-lanka-india/(Retrieved, 2016-05-14.)

http://www.telegraph.co.uk/expat/expatnews/6613354/Where-kaffir-is-no-insult.html(Retrieved, 2016-05-14.)

http://www.biyokulule.com/view-content.phparticle 5619 (Retrieved, 2016-05-10.)

http://www.sundaytimes.lk/090726/Plus/sundaytimesplus_01.html(Retrieved, 2016-05-14.)